# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
## சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
## Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
**MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE**


| මගේ අංකය<br>எனது இல<br>**My No** | DSD/HO/04/09/ජාතික ආහාර නි...... | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** | .......................................... | දිනය<br>திகதி<br>**Date** | 2018.03.14.......................... |
|---|---|---|---|---|---|

**සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2018 / 04/ ආර්ථික සවිබලගැන්වීම්**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරීන්,

සියළුම මුලස්ථාන කළමණාකරුවන් / කලාප කළමණාකරුවන් /කළමණාකාර අධ්‍යක්ෂවරුන් / ව්‍යාපෘති කළමණාකරුවන්,

සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**ආර්ථික සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන - 2018**

**“ සවිබලයයි සමෘද්ධියයි - ඉසුරු ගෙනෙන ගොවි ගෙදරයි ” සමෘද්ධි ආදර්ශ ගෙවතු සංවර්ධන වැඩසටහන - හොඳම ගොවි ගෙදර තේරීම**

වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනයක් බවට පත් කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ.

**“එක්වෙමු නැගිටිමු - අටුකොටු පුරවමු”** තේමාව යටතේ ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් මෙහෙයවන ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය - 2018 ට සමගාමීව සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2018 වර්ෂයේදී සමෘද්ධි දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් තුලින් සවිබලගැන්වීමට ඉලක්ක කර ඇති සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 125,000 ක මෙම ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වේ. මීට අමතරව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ පවතින ආයතන පරිශ්‍රයන් හා නිලධාරීන්ගේ ගෙවතු මේ සඳහා තෝරා ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙම වැඩසටහන මඟින් පවුලේ පෝෂණය ඉහල නැංවීම, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම, පවුලේ ජීවන වියදම අවම කිරීම,


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் ( மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

අතිරේක ආදායම් මාර්ගයක් පවුල් ඒකකයට ඇති කිරිම හා වසවිසෙන් තොර පරිසර හිතකාමී නිෂ්පාදනයට ප්‍රජාව හුරු කරන අතර පවුලේ අතිරික්ත ශ්‍රමය ඵලදායි නිෂ්පාදන කටයුත්තක් සඳහා යොමු කිරිමට අපේක්ෂා කෙරේ.

මෙහිදි වගාවන් සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති නාගරික හා අර්ධ නාගරික ජනතාවගේ ගෙවතු සඳහා ද බඳුන් වගාව ඇතුළු නව නාගරික කෘෂිකාර්මික තාක්ෂණ ක්‍රම යොදා ගනිමින් මෙම වැඩසටහනට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## 02. ගෙවතු වගා ක්‍රියාත්මක කරනු ලබන පරිශ්‍රයන්

1. 2018 වර්ෂයෙදි සවිබලගැන්වීම ඉලක්ක කර ඇති පවුල් 125,000 ක නිවාස ආශ්‍රිතව.
2. සමෘද්ධි ප්‍රජාමුල බැංකු සංගම් හා සමෘද්ධි ප්‍රජා මුල බැංකු සමිති පරිශ්‍ර.
3. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සියළු නිලධාරීන්ගේ ගෙවතු වල.
4. සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන පරිශ්‍රයන්

- සංවර්ධනය කරනු ලබන ගෙවතු අතරින් හොඳම ගෙවත්ත ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් තෝරා එය ආදර්ශමත් ගෙවත්ත ලෙස සංවර්ධනය කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තරඟය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගනු ලබන හොඳම ආදර්ශ ගෙවතු 03 සඳහා පිළිවෙලින් ප්‍රථම ස්ථානයට රු. 20,000.00, දෙවන ස්ථානයට රු. 15,000.00 ක් හා තුන්වන ස්ථානයට රු. 10,000.00 ක් ලෙස ඇගයීම් ත්‍යාග ලබාදීම.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මඟින් තෝරා ගනු ලබන හොඳම දිරිය තරුණ ගොවීන්/ගෙවිලියන් තිදෙනා සඳහා ඇගයීම් ත්‍යාග ඉහත පරිදි ලබාදිය යුතු අතර ඒ සඳහා ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණය රු. 45,000/- ක් වන අතර එය ඉහත පරිදි ත්‍යාගමය දීමනාවක් ලෙස ලබාදිය යුතු වේ.

- ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රචාරක කටයුතු සිදු කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදීය සඳහා එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට රු. 20,000.00 ක් බැගින් වන පරිදි ප්‍රතිපාදන වෙන් කර ඇත.

**03.** ප්‍රතිපාදන වෙන් කිරීම

| ක්‍රියාකාරකම් | ඒකක | මුදල රු. |
|---|---|---|
| එක් ග්‍රාම නිලධාරී වසමක් තුල සවිබලගැන්වීමට නියමිත පවුල් විසින් පවත්වාගෙන යන ගෙවතු අතරින් හොඳම ආදර්ශ ගෙවත්ත පවත්වාගෙන යන පවුල සඳහා රු. 5,000/- ක ත්‍යාගමය දීමනාව ලබාදීම | ගෙවතු 14022 | 70,110,000.00 |
| ඉහත පරිදි තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් තෝරා ගනු ලබන ආදර්ශ ගෙවතු අතරින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගනු ලබන හොඳම ආදර්ශ ගෙවතු 03 සඳහා ත්‍යාගමය දීමනා ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණය රු. 45,000/- කි. | ප්‍රා.ලේ. කොට්ඨාශ 331 | 14,895,000.00 |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මඟින් තෝරා ගනු ලබන හොඳම දිරිය තරුණ ගොවීන් තිදෙනා සඳහා ත්‍යාගමය දීමනා ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණය රු. 45,000/- කි. | ප්‍රා.ලේ. කොට්ඨාශ 331 | 14,895,000.00 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රචාරක කටයුතු සිදු කිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදීය සඳහා එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට රු. 20,000.00 බැගින් දිස්ත්‍රික්ක වල සියළු වැඩසටහන් සඳහා | ප්‍රා.ලේ. කොට්ඨාශ 331 | 6,620,000.00 |
| අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන හා එම ආයතන වල නිළධාරීන් සඳහා එළවළු බීජ/පැල ලබා දිම සඳහා (දිස්ත්‍රික් මට්ටමින් ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු ඇමුණුම් අංක 01 හි දක්වා ඇත) | සියළු නිලධාරීන් | 3,480,000.00 |
| මුළු මුදල | | **110,000,000.00** |

අමාත්‍යාංශය හා අමාත්‍යාංශ යටතේ ඇති ආයතන හා එම ආයතන වල නිලධාරීන් සඳහා ලබාදෙන එළවළු / පලතුරු බීජ පැකට්ටු සඳහා ලබාදිය හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු. 100/- ක් විය යුතු අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද පැල තවාන් වලින් අදාල බීජ පැකට් හෝ පැල ලබාදිය යුතු වේ.

## 04. ක්‍රියාත්මක ක්‍රමවේදය

**සමෘද්ධි ප්‍රතිලාභී පවුල් වල ගෙවතු සංවර්ධනය**

සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හා කෘෂිකර්ම උපදේශක ඇතුළු ග්‍රාමීය මට්ටමේ ක්ෂේත්‍රයේ අත්දැකීම් ලත් පුද්ගලයින් මඟින් ප්‍රතිලාභීන් දැනුම්වත් කරවීමට කටයුතු කළ යුතු වේ. ඒ අනුව ගෙවත්ත මූලිකව සැලසුම් කිරීම, යෙදවුම් සපයා ගැනීම, භූමිය සැකසීම, කාල වකවානු අනුව භූමියේ වගාවන් ආරම්භ කිරිම හා වගාවන් නිසි පරිදි පවත්වාගෙන යාමට අදාල කටයුතු කළ යුතු වේ.

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016 – 2018 ට සමගාමීව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගෙවතු වගා සංවර්ධනයට අදාලව ලබාදී ඇති ගෙවතු සංවර්ධන උපදෙස් ද මේ සඳහා දායක කර ගත හැකි වේ. ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති **'සතුටු නිවහන'** ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන් අත් පත්‍රිකා පිටපත් මීට අමුණා ඇත. (වියළි, තෙත් හා අතරමැදි කලාප සඳහා වෙන් වෙන්ව උපදෙස් සපයා ඇත.)

එමෙන්ම සියළුම ප්‍රතිලාභීන්ගේ නිවෙස් ආශ්‍රිතව පවත්වාගෙන යන ගෙවතු වල යෙදවුම් අධීක්ෂණය කිරීම්, අස්වනු ලැබීම් හා ආදායම් සටහන් කිරීම සඳහා සටහන් පොතක් පවත්වාගෙන යාමට ද පහසුකම් සලසා දිය යුතු වේ. මීට අමතරව කෙටි කාලීන බෝග වල අස්වනු නෙලීමෙන් පසු නැවත වගාව ආරම්භ කිරීම සිදු කර මෙම වැඩසටහන චිරස්ථායීව පවත්වාගෙන යා යුතු වේ.

**සමෘද්ධි වැඩසටහනට සම්බන්ධ ආයතනවල ගෙවතු වගාව.**

මේ සඳහා සියළුම සමෘද්ධි ප්‍රජා මූල බැංකු සංගම් හා සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති වල කාර්යාල වල ගෙවතු පරිශ්‍ර මේ සඳහා යොදා ගැනීමට කටයුතු සූදානම් කළ යුතු වේ. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ ගෙවතු පරිශ්‍ර වල ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. මේ යටතේ අදාල නිලධාරීන් දැනුම්වත් කිරීම්, සුදුසු පරිදි භූමි සකස් කිරීම, උචිත බෝග වර්ග යොදා ගෙන වගාවන් ආරම්භ කිරීම, නඩත්තුව හා තිරසාරව පවත්වාගෙන යාමට අවශ්‍ය මඟ පෙන්වීම් කළ යුතු වේ.

**සමෘද්ධි වැඩසටහනට සම්බන්ධ නිලධාරීන්ගේ නිවෙස් වල ගෙවතු වගාව ඇරඹීම.**

මේ සඳහා පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ,දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ කෘෂිකර්ම උපදේශකවරුන්ගේ මාර්ගයෙන් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නිලධාරීන් දැනුම්වත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කර දිය යුතු අතර සමෘද්ධි නිලධාරීන්ගේ ගෙවතු වගාවන් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීමට ද අවශ්‍ය පියවර ගත යුතු වේ.

## 05. හොඳම ගෙවතු තේරීම සඳහා වන නිර්ණායක.

1. භූමි සැලසුම් හා බෝග තෝරා ගැනීම (ඉඩකඩ ප්‍රශස්ථ ලෙස භාවිතය) .
2. කාබනික වගා රටාවකට ඇති නැඹුරුතාවය (කොම්පෝස්ට් සාදා ගැනීම, ස්වභාවික කෘමි හා පලිබෝධ මර්ධන ක්‍රම යොදා ගැනීම)
3. වගා රටාවන් හා නව වගා ක්‍රම භාවිතය (තිරස් වගාව සහ සිරස් වගාව)
4. පාංශු හා ජල සංරක්ෂණයට යොදා ඇති උපාය මාර්ග.
5. භූමි අලංකරණය හා ඉඩමේ පවිත්‍රතාවය.
6. ගෘහස්ථ මට්ටමින් සත්ත්ව පාලන ව්‍යාපෘති සඳහා යොමු වීම.
7. ඉඩමේ ආරක්ෂාව සහ සජීවී වැටක් නිර්මාණය කිරීම.
8. අතිරික්ත නිෂ්පාදන අලෙවිය සඳහා භාවිතා කරන ක්‍රම වේද.
9. පවුලේ ශ්‍රමය කාර්යක්ෂමව යොදා ගැනීම.
10. පරිසර හිතකාමී ලෙස චිරස්ථායිව ගෙවත්ත පවත්වාගෙන යාම.

ඉහත සඳහන් නිර්ණායකයන් ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ හොඳම ආදර්ශවත් ගෙවත්ත තේරීම සඳහා හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හොඳම සමෘද්ධි ගොවි පවුල් තිදෙනා තේරීම සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ හොඳම සමෘද්ධි තරුණ ගොවියා / ගෙවිලිය තෝරා ගැනීම සඳහා විශේෂයෙන් යොදා ගත යුතු වේ.

මීට අමතරව හොඳම තරුණ ගොවීන්/ගෙවිලියන් තිදෙනා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරා ගැනීමේදී ඉහත නිර්ණායක වලට අමතරව අවිවාහක තරුණයෙකු වීම / තරුණියක වීම, වයස අවුරුදු 18 – 35 අතර වීම සහ පූර්ණ කාලීනව වගා කටයුතු වල යෙදීම යන කරුණු කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කළ යුතු වේ.

## 06. ආදර්ශ ගෙවත්ත සැලසුම් කිරිම

මෙමඟින් එදිනෙදා පරිභෝජනයට අවශ්‍ය පෝෂ්‍යදායී හා වසවිසෙන් තොර එළවළු පලතුරු හා අනෙකුත් හා පලා වර්ග , කෙටි කාලීන බෝග, මධ්‍ය කාලීන බෝග හා දිගු කාලීන බෝග වලින් පරිපූර්ණ සැලසුම් කල ගෙවත්තක් නිර්මාණය කිරීමට කටයුතු කළ යුතු වේ.

## 07. යෙදවුම් සපයා ගැනීම

තෝරා ගන්නා පවුල් මෙම වැඩසටහන පිළිබඳව මනා ලෙස දැනුම්වත් කර අවශ්‍ය බීජ, පැල හා රෝපණ ද්‍රව්‍ය සපයා ගැනීම,අවශ්‍ය උපකරණ හා අනෙකුත් යෙදවුම් සපයා ගැනීම සහ කාබනික පොහොර සපයා ගැනීම /නිෂ්පාදනය කර ගැනීමට සහාය දිය යුතු වේ. එමෙන්ම අවශ්‍යතාව අනුව ණය පහසුකම් සඳහා සමෘද්ධි ප්‍රජා මුල බැංකු වෙත යොමු කිරීම හා ණය පහසුකම් ලබාදීමට පහසුකම් සලසා දිය යුතු වේ.

## 08. පොදු කරුණු

- ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන මෙම ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ එක් ග්‍රාම නිලධාරී වසමක් වෙනුවෙන් රු. 5,000/- ක හොඳම ගෙවත්ත පවත්වාගෙන යන සමෘද්ධි ප්‍රතිලාභියා සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. එම මුදලින් මෙම ගෙවත්ත තවදුරටත් ආදර්ශ ගෙවත්තක් ලෙස සංවර්ධනය කළ යුතු වේ. (රාජ්‍ය ආයතන හා නිලධාරින් සඳහා අවශ්‍ය බීජ, පැල හෝ වෙනත් රෝපණ ද්‍රව්‍ය පමණක් ලබා දිය යුතු වේ)

- එමෙන්ම ඔබ දිස්ත්‍රික්කයේ පවත්නා සමෘද්ධි ප්‍රජා මූල බැංකු සංගම් හා සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති පරිශ්‍ර වල ගෙවතු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු අතර ඒවා අතරින් හොඳම ප්‍රජා මූල බැංකු හෝ සමිති 03 සඳහා ත්‍යාගමය දීමනා බැංකු මූල්‍ය අංශය මඟින් ලබාදීමට ක්‍රියා කරනු ඇත.

- දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල පරිශ්‍රයන් වල ඉඩකඩ ප්‍රමාණය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරන අතර මෙහිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට කැමති, ගෙවත්තේ ඉඩ කඩ ඇති දෙපාර්තමේන්තුවට අයත් නිලධාරින්ගේ නිවාස වලද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල යුතු වේ.

- සෑම ග්‍රාම නිලධාරී වසමකම මෙම වැඩසටහන ආරම්භ කිරීමට පෙර තෝරාගත් ප්‍රතිලාභීන් එක් රැස්කර මෙම වැඩසටහන ආරම්භ කිරීමට අදහස් හා යෝජනා ලබාගත යුතු අතර මෙය අදාල ගෙවතුලාභීන් සඳහා ඉලක්ක ලබා දෙමින් ඉලක්ක ගත වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ.

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි සංවර්ධන නිලධාරිගේ මූලිකත්වයෙන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර සහ කෘෂි උපදේශක මඟින් තාක්ෂණික උපදෙස් ලබාදී අදාල දැනුම්වත් කිරීම් කළ යුතුය.

- මෙම වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති වාර්තාවන් සකස් විය යුතු අතර එය සවිබලගැන්වීමේ වැඩසටහන සමඟ බද්ධකර පවත්වාගෙන යා යුතු වේ. එමෙන්ම දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති වාර්තාව ප්‍රධාන කාර්යාලය වෙත එවිය යුතු වේ.

- ගෙවත්ත ආදර්ශ ගෙවත්තක් ලෙස වස විස භාවිතයෙන් තොර පරිසර හිතකාමී ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යමින්, පවුලේ වියදම අවම කර ආදායම් වැඩි කිරීමේ ක්‍රම වේදයක් ලෙස යොදා ගත යුතු වේ. මේ සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ඉලක්ක ලබාදිය යුතු වේ.

- එහිදි ගෙවත්ත සැලසුම් කිරීම, භූමිය සකස් කිරීම, යෙදවුම් ලබා දීම, වගාව අරම්භ කිරීම, පවත්වාගෙන යාම නඩත්තු කිරීම, ප්‍රගතිය හා වාර්තා කරණය සඳහා පිළිබඳව වගා කාල සටහන් / වගා දින දර්ශන සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. එමෙන්ම නොකඩවා ගෙවත්ත පවත්වාගෙන යාම පිළිබඳව උපදෙස් ලබා දිමට කටයුතු කළ යුතු වේ. මීට අමතරව ගෙවතුලාභීන් මුහුණදිය හැකි පාරිසරික අභියෝගයන් ජය ගැනීම වෙනුවෙන් උපාය උපක්‍රම යොදා ගනිමින් ගෙවතු වගාව තිරසාරව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දිම වැදගත්ය

- ගෙවතු සංවර්ධනයේදී පාරම්පරික පලිබෝධ හා කෘමි මර්ධන ක්‍රමවේද සහ කාබනික පොහොර යොදා අදාල වගා කටයුතු සිදු කිරීම මඟින් අප ද්‍රව්‍ය කළමණාකරණයට දිරිමත් කළ යුතු වේ.

- ග්‍රාම නිලධාරී වසම් මට්ටමේ හොඳම ආදර්ශ ගෙවත්ත තෝරා ගැනීම කමිටුවක් මඟින් සිදු කළ යුතු වේ. එම කමිටුව සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ සභාපතීත්වයෙන් ග්‍රාම නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර යන නිලධාරීන් ඇතුලත් විය යුතු වේ.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හොඳම ගොවි පවුල් තිදෙනා තෝරා ගැනීම හා හොඳම තරුණ ගොවීන් / ගෙවිලියන් තිදෙනා තෝරා ගැනීම කමිටුවක් මඟින් සිදු කිරීමට වග බලා ගත යුතු වේ. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතීත්වයෙන් මූලස්ථාන සමෘද්ධි කළමණාකරු, කළමණාකාර අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමණාකරු හා කෘෂිකර්ම උපදේශක ඇතුලත් විය යුතු වේ.

- ගෙවත්ත ආරම්භ කිරීමට පෙර ගෙවත්ත හා සංවර්ධනය කිරීමෙන් අනතුරුව ගෙවත්ත ඡායා රූප ගතකර තබා ගත යුතු අතර අවශ්‍ය ඕනෑම විටක තොරතුරු ලබා ගැනීමට හැකි වන පරිදි තබා ගත යුතු වේ.

- සෑම ආදර්ශ ගෙවත්තක් සඳහාම 2018 සමෘද්ධි ආදර්ශ ගෙවතු සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද බවට සඳහන් දැන්වීම් පුවරුවක් සවි කළ යුතු වේ.

## 09. සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ කාර්යය භාරය

2018 වර්ෂයේ දී සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන් විසින් සවිබලගැන්වීමට ඉලක්ක කර ඇති පවුල් වල ගෙවතු සංවර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම එම ගෙවතු වගා සංවර්ධනය සඳහා තම ගෙවත්ත සූදානම් කිරිමට අවශ්‍ය තාක්ෂණික සහාය සේවා ලබාදීමට කටයුතු කිරීම හා යෙදවුම් සපයා ගැනීමට අවශ්‍ය දිරිමත් කිරීම් කළ යුතු වේ. එමෙන්ම මෙම ගෙවතු සංවර්ධන වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම , මෙහෙයවීම හා පසු විපරම් ක්‍රියාවලිය සිදු කිරීම තමාගේ අධීක්ෂණයෙන් සිදු කිරීමට වග බලා ගත යුතු වේ. එමෙන්ම ගෙවතු වගා වැඩසටහන වගා කාලසටහන - වගා දින දර්ශනයක් අනුව ඉලක්ක ගත වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කළ යුතු වේ.

එමෙන්ම තම බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක ගෙවතු අතරින් හොඳම හා ආදර්ශ ගෙවත්ත තෝරා ගැනීමට කටයුතු කර එම ප්‍රතිලාභියා සඳහා ලබාදෙන ත්‍යාගමය දීමනාවෙන් එම ගෙවත්ත මනාව සංවර්ධනය කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ගෙවතු වගා තරඟය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

## 10. කාල රාමුව

ඇමුණුම් 02 හි දක්වා ඇත.

## 11. ව්‍යාපෘති අධීක්ෂණය,මෙහෙයුම් හා ඇගයුම් කටයුතු

1. මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඊ - සමෘද්ධි ව්‍යාපෘතියේ (e–samurdhi Project) ඇති ව්‍යාපෘති හා වැඩසටහන් කළමණාකරණ මොඩියුලයට (Project & Programme Management Module) ඇතුලත් කිරීමටත් ප්‍රගතිය නිසි පරිදි නියමිත දිනටම යාවත්කාලීන කිරීමටත් ව්‍යාපෘති කළමණාකරු මෙම වසරේ සිට කටයුතු කිරීම **අත්‍යාවශ්‍ය** වනු ඇත.

2. ව්‍යාපෘති අධීක්ෂණය හා පසු විපරම් කිරීමේ ක්‍රමවේදයන් සකස් කර ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රාදේශීය මට්ටමටද අවශ්‍ය උපදෙස් ලබාදීම වැදගත් වේ. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචනයන් සිදු කල යුතු අතර ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී විම අත්‍යාවශ්‍ය වේ.

3. මෙහිදී ප්‍රජාමූල සංවිධාන ද ව්‍යාපෘති අධීක්ෂණය සඳහා සහභාගී කරවා ගත යුතු අතර, සමාජ විගණනයන් සඳහා අවශ්‍ය පරිසරයක් ඇති කල යුතු වේ.

4. සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් විසින් තම අදාල අධීක්ෂණ කටයුතු සිදු කිරීම වැදගත් වේ.

## 12. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ හා ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේදී මෙන්ම මාසිකව පැවැත්වෙන සමෘද්ධි මුලස්ථාන කළමණාකරුවන්ගේ රැස්වීමේදී මෙහි ප්‍රගතිය සාකච්ඡා කිරීමට වගබලාගත යුතු වේ.

මීට අමතරව මුලස්ථාන කළමණාකරු , ව්‍යාපෘති කළමණාකරු, කලාප කළමණාකරුවන් හා වසමේ සේවය කරන සමෘද්ධි සංවර්ධන නිලධාරී මුහුණදෙන ගැටළු ද සාකච්ඡා කර මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මත කර නිලධාරීන් සොයා බලා විශේෂ ඇගයීමකට ලක් කිරීම කළ යුතු වේ.

**13. ප්‍රගති වාර්තා එවීම.**

- වසම් මට්ටමින් ප්‍රගති වාර්තා සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මූලස්ථාන සමෘද්ධි කළමණාකරු වෙත කලාප කළමණාකරු මඟින් සෑම මසකම 25 දිනට පෙර එවිය යුතු වේ.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රගති වාර්තා සෑම මසකම 30 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ගෙන්වා ගත යුතු වේ.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා සෑම මසකම 05 දිනට පෙර අමාත්‍යාංශයට පිටපත් සහිතව දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වේ.
- දිස්ත්‍රික්කයේ සමස්ථ වැඩසටහන දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මෙහෙයවීම අධීක්ෂණය හා පසුවිපරම් ක්‍රියාවලිය මනා සම්බන්ධීකරණයක් තුලින් ක්‍රියාත්මක කළ යුතු වේ.

**14. පසුවිපරම හා ඇගයීම.**

මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක සියළු ආදර්ශ ගෙවතු නිරන්තර අධීක්ෂණය කිරිම මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට හේතු වන ප්‍රධාන සාධකයකි.

සියළුම ප්‍රතිලාභීන් තම ගෙවත්තෙන් ලැබෙන ආදායම් සහ වියදම් පිළිබඳ සටහන් තබාගත යුතු අතර සෑම සතියකටම වරක් අදාල වසමභාර සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් මෙම සටහන් පරීක්ෂා කළ යුතු අතර එහි වාර්තා සටහන් තැබිය යුතු වේ. එමෙන්ම මසකට වරක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වෙත අදාල ගෙවත්ත නිරීක්ෂණයට යොමු කර අදාල සටහන් පොතේ වාර්තා සටහන් තබා ගැනීමට කටයුතු සලසා දීම වැදගත් වේ.එමෙන්ම ගෙවත්තෙන් ලැබෙන අස්වනු පරිභෝජනය මෙන්ම අතිරික්තය අලෙවියෙන් ලබන ආදායම් සඳහා වන ප්‍රාදේශීය වටිනාකම් ඇතුලත් කර දෛනික ආදායම් මෙන්ම වියදම් ද ඇතුලත් කර ගිණුම් සටහන් තබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

මෙම චක්‍රලේඛය පිළිබඳව වැඩි දුර විස්තර අවශ්‍ය වුවහොත් දුරකතන අංක 011-2873801 / 011-2869824/ 011-2872253 මගින් හෝ divinegumalh@yahoo.com විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් සමාජ සවිබලගැන්වීම් හා ග්‍රාම සංවර්ධන අංශය අමතන්නේ නම් මැනවි.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ ගරු අමාත්‍ය එස්.බී දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. ලේකම්, සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය -කා.දැ.ගැ. පි.
4. අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන /සමෘද්ධි), සමාජ සවිබලගැන්වීම්,සුභසාධන හා කන්ද උඩරට උරුමය අමාත්‍යාංශය - කා.දැ.ගැ. පි.
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ. පි.
6. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ. පි.
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ. පි.
8. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ. පි.